# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2300/12 - 2022 ඔක්තෝබර් මස 05 වැනි බදාදා - 2022.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි ''**2022 අංක 17 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි**'' ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත, 2012 ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. ඉහතින් සඳහන් කරන ලද 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් රෙගුලාසිවල අංක 6 (1) රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද, මෙම රෙගුලාසිවල IV වන උපලේඛනයේ දක්වා ඇති කෘෂිකාර්මික බීජ, කෘෂිරසායන සහ රසායනික පොහොර ආනයනය කිරීමට ශ්‍රී ලංකා රුපියල් ගිණුමකින් කරන ලද අත්තිකාරම් ගෙවීමක් (මුදල් අත්තිකාරම්) සඳහා එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ පනස් දහසක් දක්වා (ඇ. ඩො. 250,000) හෝ ඊට සමාන වෙනත් යම් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදලක් දක්වා අවසර ලබා දෙනු ලැබේ.

4. ඉහත රෙගුලාසි අංක 3 හි අරමුණ උදෙසා, පහත IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කෘෂිකාර්මික බීජ, කෘෂි රසායන සහ රසායනික පොහොර මෙයින් ඇතුළත් කරන අතර, ඉහතින් සඳහන් කරන ලද 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් රෙගුලාසිවල අංක 8 දරන රෙගුලාසියේ අනිවාර්ය අංගයක් ලෙස කියවිය යුතුය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## IV උපලේඛනය

| *අංකය* | *කාණ්ඩය* | *HS සංකේතය* |
|---|---|---|
| 1 | බෝංචි බීජ | 0713.33.10 |
| 2 | ඉරිඟු බීජ | 1005.10.00 |
| 3 | බඩ ඉරිඟු බීජ | 1005.10.00 |
| 4 | එළවළු බීජ | 1209.91.00 |
| 5 | පළතුරු බීජ | 1209.99.10 |
| 6 | මැග්නීසියම් සල්ෆේට් | 2833.21.00 |
| 7 | සින්ක් සල්ෆේට් | 2833.26.10 |
| 8 | පාංශු කන්ඩිෂනර් | 2836.50.00 |
| 9 | යූරියා | 3102.10.00 |
| 10 | එස්. ඕ. ඒ. | 3102.21.00 |
| 11 | කැල්සියම් නයිට්රේට් | 3102.60.00 |
| 12 | ටී. එස්. පී. | 3103.11.00 |
| 13 | එම්. ඕ. පී. | 3104.90.00 |
| 14 | එන්. පී.කේ. ද්‍රාව්‍ය මිශ්‍රණ | 3105.20.00 |
| 15 | ඇල්බට් ද්‍රාවණය | 3105.20.10 |
| 16 | ඩී. ඒ. පී. | 3105.30.00 |
| 17 | කීසරයිට් | 3105.30.00 |
| 18 | එන්. පී.කේ. ද්‍රාව්‍ය නොවන/අර්ධ වශයෙන් ද්‍රාව්‍ය මිශ්‍රණ | 3105.90.00 |
| 19 | කෘමිනාශක | 3808.91.90 |
| 20 | දිලීර නාශක | 3808.92.90 |
| 21 | වල්නාශක | 3808.93.90 |
| 22 | ජෛව උත්තේජක | 3824.99.90 |

EOG 10 - 0103

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.